51(1)

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. : HRC/943/19 | ඔබේ අංකය / உமது இல. / Your No. : | දිනය / திகதி / Date : 2022.02.09. |

පැමිණිලි පාර්ශවය : ඒ.එම්.එන්.චාමින්ද,
අංක : 65/ඩී, සරසවි උයන,
සූරියපාළුව, කඩවත.

වගඋත්තර පාර්ශවය : උපකුලපති,
කැලණිය විශ්ව විද්‍යාලය,
දළුගම, කැලණිය.

**පැමිණිලි අංකය : HRC/943/19**

පැමිණිල්ල :-

පැමිණිලිකරු කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කරමින් සඳහන් කර සිටින්නේ, තමන් 2002.12.10 දිනැති පත්වීම් ලිපිය ප්‍රකාරව 2003.03.01 දින පටන් කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ කථිකාචාර්යවරයෙක් ලෙස සේවය ආරම්භ කරන ලද බවත්, ඉන්පසුව 2014 වසරේදී ආචාර්ය උපාධිය සම්පූර්ණ කරන ලද බවත්, 2014.01.11 දිනැතිව ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය පළමු ශ්‍රේණියට උසස් කරන ලද බවත්ය.

පසුව විශ්ව විද්‍යාලය විසින් ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය යටතේ පැවති දේශපාලන විද්‍යා සංඛ්‍යානය සහ ජාත්‍යන්තර අධ්‍යයනය යන විෂයන් නව අධ්‍යනාංශ ලෙස වෙන් කරන ලද බවත්, ඒ අනුව 2017.10.04 දිනැති ලිපිය මගින් ජ්‍යාන්තර අධ්‍යයන අංශයට පැමිණිලිකරු අනුයුක්ත කර ඇති බවත්, ජාත්‍යන්තර අධ්‍යයන අංශයේ ආචාර්ය මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන් අතරින් ජ්‍යෙෂ්ඨත්වයෙන් සහ පළපුරුද්දෙන් වැඩිම ආචාර්යවරයා ද, ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය පළමු ශ්‍රේණියේ එකම ආචාර්යවරයා ද, ආචාර්ය උපාධියක් හිමි එකම කථිකාචාර්යවරයා ද, පරිපාලන අත්දැකීම් සහිත එකම ජ්‍යේෂ්ඨතමයා වන්නේ ද පැමිණිලිකරු බවත්ය.

කෙසේ නමුත්, 2017.10.04 ලිපිය මගින් පැමිණිලිකරු ජාත්‍යන්තර අධ්‍යයන අංශයට පත් කරන ලද පසුව අංශාධිපති ධූරයට පත් කරන ලද්දේ ඔහුට වඩා කණිෂ්ඨ තවක ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරයෙක් බවත්, එම කථිකාචාර්යවරයා සිය ආචාර්ය උපාධිය සඳහා විදේශ ගතවීම සඳහා අංශාධිපති ධූරයෙන් ඉවත් වූ බවත්, ඒ අනුව ජාත්‍යන්තර අධ්‍යයන අංශයේ අංශාධිපති ධූරය පුරප්පාඩු වී තිබූ බවත්, එහිදී ජ්‍යේෂ්ඨත්වය, අධ්‍යාපන සුදුසුකම් සහ පරිපාලන


| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541 / 74 |
| ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrcsl@gmail.com | | | | |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 -11- 2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 |
| වෙබ් / இணையம் / Web | www.hrcsl.lk | | | | |

අත්දැකීම් සියල්ලෙන්ම ප්‍රමුඛයා ලෙස වසර 16 ක සේවා කාලයක් සහිත පැමිණිලිකරු වෙනුවට 2013 ඔක්තෝම්බර් මස බඳවාගත් කණිෂ්ඨතම කථිකාචාර්යවරයා තෝරාගෙන ඇති බවත්, ඒ අනුව සියළු සුදුසුකම් සපුරා තිබූ තමාට අවස්ථාව ලබා නොදීමෙන් තමාගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවත්ය.

වගඋත්තරකරුගේ කරුණු සැලකිරීම :-

වගඋත්තර පාර්ශවය කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයට පෙනීසිටිමින් සඳහන් කර සිටින්නේ, 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 51.1 උප වගන්තිය ප්‍රකාරව සහ එකී පනතේ 1985 අංක 7 දරණ සංශෝධිත පනතේ 30 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ජාත්‍යන්තර අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන තනතුර සඳහා පත්කරනු ලබන බවත්, ඒ අනුව උපකුලපතිවරයාගේ නිර්දේශ මත පාලක සභාව විසින් පත් කරනු ලබන මහාචාර්යවරයෙක්, සහාය මහාචාර්යවරයෙක් හෝ ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරයෙක් අධ්‍යයන අංශ ප්‍රධානියෙකු ලෙස පත්කල හැකි බවත්, එම වගන්තියේම 2 උපවගන්තිය ප්‍රකාරව එසේ පත්කරනු ලබන තැනැත්තෙකු උචිත සාධන පත්‍රයක විධිවිධාන වලට යටත්ව කලින් දූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස වසර 3ක් සඳහා ධූරකාලය දැරීමටත්, නැවත පත්කිරීමටත් සුදුස්සකු වන බව විශ්ව විද්‍යාල පනතේ සඳහන්ව ඇති බවයි.

ඒ අනුව මෙම ප්‍රතිපාදනයන්ට අනුකූලව සමාජ විද්‍යා, විද්‍යා පීඨයේ ජාත්‍යන්තර අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානියා ලෙස බී.ඩබ්.එන්.එස්. ප්‍රියදර්ශන මහතා පත්කර ඇත්තේ පාලක සභා තීරණයක් අනුව බවත්, කිසියම් අධ්‍යයන අංශ ප්‍රධානියකු ලෙස කටයුතු කිරීමේදී අදාළ අංශයේ කටයුතු වල සාර්ථකත්වය සඳහා එම අධ්‍යයන අංශය මගින් උගන්වන විෂය පිළිබඳව මනා දැනුමක් ඇති අයෙකු පත් කිරීම වඩාත් සුදුසු බව ද සඳහන් කර ඇත.

පැමිණිලිකරු කැලණිය විශ්ව විද්‍යාලයේ සාමාජිය විද්‍යා පීඨයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ කථිකාචාර්යවරයකු ලෙස 2003.03.01 දින සිට සේවය කර ඇති නමුත්, 2017 එකී ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය යටතේ පැවති විෂය එම අධ්‍යයන අංශයෙන් වෙන්කර දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, සමාජ විද්‍යා අධ්‍යයන අංශය සහ ජාත්‍යන්තර අධ්‍යයන අංශය ලෙස වෙන් කිරීමෙන් අනතුරුව ජාත්‍යන්තර අධ්‍යයන අංශය වෙත අනුයුක්ත කර ඇති අතර, පැමිණිලිකරුගේ මූලික උපාධිය මෙන්ම ආචාර්ය උපාධිය ද ලබා ඇත්තේ ජාත්‍යන්තර අධ්‍යයනය සම්බන්ධව නොවන බවත්, දේශපාලන විද්‍යාව සම්බන්ධයෙන් බවත්, අංශ ප්‍රධානි වශයෙන් පත්කර ඇති බී.ජ්.එන්.එස්.ප්‍රියදර්ශන මහතා ජාත්‍යන්තර අධ්‍යයනය සම්බන්ධව මූලික උපාධිය මෙන්ම පශ්චාත් උපාධිය ද ලබා ඇති බවයි. එබැවින්, අදාළ විෂය පිළිබඳව වැඩි දැනුමක් ඇති අයෙකු අංශාධිපති ලෙස පත්කිරීම කර ඇති බව වැඩිදුරටත් කරුණු දක්වමින් සඳහන් කර ඇත.

**කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු** :-

පැමිණිලිකරු 2001 වර්ෂයේදී සහකාර කථිකාචාර්යවරයකු වශයෙන් කැළණිය විශ්ව විද්‍යාලයේ සේවයට බැදී ඇති අතර, 2003 වර්ෂයේදී කථිකාචර්යවරයෙකු වශයෙන් සේවය ස්ථිර කොට ඇත.

2005 වර්ෂයේදී පැමිණිලිකරු සිය පශ්චාත් උපාධිය සඳහා විදෙස් ගත වන අවස්ථාව දක්වාම සාමාජීය විද්‍යා පීඨය ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ දේශපාලන විද්‍යාව හා ජාත්‍යන්තර අධ්‍යයන විෂයන්හි ආචාර්යවරයකු වශයෙන් කටයුතු කර ඇත.

2005 වර්ෂයේදී පැමිණිලිකරු සිය ශාස්ත්‍රපති (එම්.ඒ. උපාධිය) හැදෑරීම සඳහා ජපානයට ගොස් ඇති අතර, ඔහුගේ පශ්චාත් උපාධිය ජාත්‍යන්තර විෂයධාර ඔස්සේ සම්පූර්ණ කොට ඇත. එසේම 2007 වර්ෂයේදී පැමිණිලිකරු සිය ආචාර්ය උපාධිය සම්පූර්ණ කොට ඇත. එකී ආචාර්ය උපාධියේ කොටසක් ලෙස ජාත්‍යන්තර සබඳතා සමග බැදී ඇති ජාත්‍යන්තර දේශපාලනය විෂය ක්ෂේත්‍රය හදාරා ඇති බව අනාවරණය වේ.

පැමිණිලිකරු 2012 වසරේදී සිය ආචාර්ය උපාධිය හදාර අවසන් කොට ලංකාවට පැමිණ ඇති අතර, නැවත කැළණිය විශ්ව විද්‍යාලයේ සාමාජීය විද්‍යා පීඨයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ කථිකාචාර්යවරයකු වශයෙන් නැවත සේවය ආරම්භ කොට ඇත. ඒ අනුව 2012 වර්ෂයේ සිට පැමිණිලිකරු දේශපාලන විද්‍යාව සහ ජාත්‍යන්තර සබඳතා විෂය පථයට අදාලව සිය ඉගැන්වීම් කටයුතු සිදුකොට ඇති බව දෛනික ඉගැන්වීම් විෂයන් දැක්වෙන ලේඛනයන් පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වේ.

2014 වර්ෂයේදී ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, ජාත්‍යන්තර සහ සමාජ සංඛ්‍යාන අංශය ලෙස වෙන් වෙන් වූ නව අධ්‍යයන අංශ ලෙස පිහිටුවීම සිදුකොට ඇති අතර, පැමිණිලිකරු ජාත්‍යන්තර අධ්‍යයන අංශයේ ආචාර්යවරයකු ලෙස ඔහුගේ කැමැත්ත අනුව තෝරාගෙන ඇත. ඒ අනුව ඉහත අධ්‍යයන අංශ තුන සඳහා තෝරාගෙන ඇති ආචාර්ය මණ්ඩලයන් අතරින් වඩාත්ම වැඩිම අධ්‍යාපන සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨත්වයක් ඇති පුද්ගලයන් අංශාධිපති වශයෙන් තෝරා ගෙන ඇති බව සෙසු අධ්‍යයන අංශ දෙකෙහි අංශාධිපතිවරුන් පිළිබඳව කරුණු කැඳවීමේදී අනාවරණය වී ඇත.

නමුත් ජාත්‍යන්තර අධ්‍යයන අංශය එනම්, පැමිණිලිකරු ආචාර්යවරයකු ලෙස බඳවා ගෙන ඇති අධ්‍යයන අංශයේ අංශාධිපති පත් කිරීමේදී ඉහත නිර්ණායකයන් එනම්, වැඩිම අධ්‍යාපන සුදුසුකම් සහ ජ්‍යෙෂ්ඨත්වයක් ඇති පුද්ගලයා තෝරා නොගනිමින් අඩු ජ්‍යෙෂ්ඨත්වයක් ඇති පුද්ගලයෙකු අංශාධිපති ලෙස පත්කොට ඇති බව පැමිණිලිකාර පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කොට ඇත. පැමිණිලිකරු විසින් ඉදිරිපත් කොට ඇති එකී කරුණු බිඳහෙලීම සඳහා වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාව හමුවේ කිසිදු අවස්ථාවක උත්සාහ දරා නොමැති අතර,

වගඋත්තරකාර පාර්ශවය ඉදිරිපත් කොට ඇති එකම තර්කය වී ඇත්තේ කැළණිය විශ්ව විද්‍යාලයේ යම් අධ්‍යයන අංශයක අංශ ප්‍රධාන තනතුර සඳහා පත්කිරීම් සිදුකිරීම 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 51(1) උපවගන්තිය ප්‍රකාරව සිදුකල යුතු වන බවට වන කරුණයි

1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 51(1) උපවගන්තිය අනුව උපකුලතිවරයාගේ නිර්දේශය මත පාලක සභාව විසින් පත්කරනු ලබන මහාචාර්යවරයෙක් සහාය මහාචාර්යවරයෙක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් හෝ කථිකාචාර්යවරයෙක් අධ්‍යයන අංශයක කථිකාචාර්යවරයෙක් වන්නේය යනුවෙන් සඳහන් වේ.

තවද පැමිණිලිකරු ජාත්‍යන්තර සබඳතා අංශයේ ඉගැන්වීමට අනුයුක්ත කර ඇති අයෙකු එහි අංශාධිපති කිරීමට නොහැකි බව දැක්වීම ද පදනම් විරහිත කරුණකි. ජාත්‍යන්තර අධ්‍යයන අංශයේ ළමුන්ට ඉගැන්වීම් කටයුතු කිරීමට අනුයුක්ත කිරීමත් කර තිබියදී එම අංශයේ කලමණාකාරිත්වය සඳහා පැමිණිලිකරුගේ ජ්‍යෙෂ්ඨත්වය හා සුදුසුකම් ප්‍රමාණවත් නොවීම පිළිබඳව වගඋත්තර පාර්ශවය දක්වන පදනමක් නොමැති කරුණු පිළිබඳව කොමිෂන් සභාවේ අවධානයට ලක්වේ.

1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 51(1) උපවගන්තිය අනුව උපකුලපතිවරාගේ නිර්දේශය මත පාලක සභාව පත්කරනු ලබන මහාචාර්යවරයෙක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් අධ්‍යයන අංශයක ප්‍රධානියා වන්නේය යන්න දක්වා තිබීම මත එම අංශයේ සිටින ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ලෙස මෙම පැමිණිලිකරුට එම තනතුර පිළිබඳ නීත්‍යානුකූල අපේක්ෂාවක් ඇතිවිය හැක. ඒ අනුව ඉහත වගන්තියේ පෙළගැස්ම අනුව පැමිණිලිකරුට බලාපොරොත්තුවක් ඇතිවීම සාධාරණ බව තිරීක්ෂණය වේ.

ඔසේම, වගඋත්තරකාර පාර්ශවය වෙතින් මේ පිළිබඳව කරුණු විමසීමේදි මෙම පැමිණිලිකරු මෙම විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය කටයුතු අධ්‍යක්ෂ තනතුරේ සේවය කරමින් සිටියදි 2017.03.16 දිනැති ලිපිය මගින් පෞද්ගලික කාරණා පදනම් කරගෙන හදිසියේ ඉල්ලා අස්වූ බවත්, ඒ අනුව උපකුලපතිතුමා වැඩභාර ගැනීමට නියමිත දිනයේදීම වගකිවයුතු තනතුරෙන් ඉල්ලා අස්වීම වගකිවයුතු තනතුරක් දරණ ආචාර්යවරයකුගෙන් බලාපොරොත්තු විය නොහැකි තත්වයක් බව දක්වා තිබීම තුළින් එම කාරණාව ද මෙම අධ්‍යයන අංශාධිපති තනතුර ලබාදීමේදී සලකා ඇති බව තිරීක්ෂණය වේ.

ඒ අනුව අධ්‍යයන අංශයේ කලමණාකාරිත්වය සඳහා පත්කරනු ලබන අංශාධිපති තනතුර සඳහා මෙම පැමිණිලිකරු පත්කර නොමැත්තේ පදනමක් නොමැතිව බව කොමිෂන් සභාවේ අවධානයට ලක්වේ.

තවද, පත්කිරීම සඳහා අභිමතයක් පැවතීමේදී එම අභිමතය අත්තනෝමතික නොවිය යුතු අතර, එම ක්‍රමවේදය පදනම් සහිත විනිවිදභාවයකින් යුක්ත විය යුතු බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

**නිගමනය : -**

ඒ අනුව වගඋත්තර පාර්ශවය විසින් ජාත්‍යන්තර අධ්‍යයන අංශයට අංශාධිපති තනතුරට සුදුසුකම් ලද්දෙකු පත් කිරීමේදී නියමිත සුදුසුකම් සපුරා ඇති ආචාර්යවරයෙකු පත් කිරීම අත්තනෝමතිකව හා අභිමතය නීත්‍යානුකූල නොවන ආකාරයෙන් ක්‍රියාත්මක කරමින් පත් කිරීම සිදුකර ඇති බව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අතර, එකී ක්‍රියාව හේතුවෙන් පැමිණිලිකරු හට වෙනස් කොට සැලකීමක් සිදුකොට ඇති බවට නිගමනය කරමු.

**නිර්දේශය :-**

1. ඒ අනුව ජාත්‍යන්තර අධ්‍යයන අංශයේ අංශාධිපති තනතුරට පැමිණිලිකාර ඒ.එම්.එන්.චාමින්ද මහතා පත් කිරීමට පියවර ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2. තවද, ආයතනය තුළ අංශාධිපති තනතුරට පත් කිරීමේදී විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට ආයතන ප්‍රධානීන් විසින් පියවර ගත යුතුය.

2022. 09. 08 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සළස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදුනොකරන්නේ නම්, පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

සං/-

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka